**හම්බන්තොට ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය

සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී මාර්ග සංවර්ධනය වෙනුවෙන් දරන ලද රු. 5,709,200 ක් වූ ප්‍රාග්ධන වියදම හා සමාලෝචිත වර්ෂයේදී විදුලි උපාංග සවිකිරීමට වැයකළ රු.38,278 ක් වූ පුනරාවර්ථන වියදම ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ණයහිමි ප්‍රතිපාදන රු. 3,648,318 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 දෙසැම්බර් මස ගිවිසුම්ගත වූ මෙම කර්මාන්ත මැතිවරණය අවසන් වන තෙක් ක්‍රියාත්මක නොකරන ලෙස සභාවට දැනුම් දුන්බව. | ණයහිමියන් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගලිබවුසරය කුලියට ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු රු.385,280 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව. | ණයගැතියන් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.342,643 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු. 403,416 ක් ලැබිය යුතු අදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විදුලිබල මණ්ඩලය වෙතින් ඉල්ලීම් කළ නිසා ලැබිය යුතු අදායමක් ලෙස ගිණුම්ගත කළ බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වැඩියෙන් අයකළ රු.49,953 ක් වූ පොළ බදු වාරික මුදල් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව. | ණයහිමියන් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |
| (උ) | ඉකුත් වර්ෂයේ ගොඩවාය ධීවර වරාය ආලෝකකරණය වෙනුවෙන් ලැබිය යුතු රු.124,325 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු. 21,287,171 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පෙර සිට පැවත එන මෙම ශේෂයන් සඳහා උපලේඛනයක් ලබාදීමට තොරතුරු නොමැති බව . | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 218 වන වගන්තිය | වර්ෂයකට වරක් සභාවේ ඉඩම් හා ගොඩනැගිලි හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකළ බවත්, ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කර වාර්තා විගණනයට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 2010 - 2012 වර්ෂයන් වලදී ලබාදී තිබූ තත්ව පරීක්ෂණ ගාස්තු අත්තිකාරම් රු. 209,457 ක් සම්බන්ධයෙන් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණු අතර හිඟ ශේෂය තුළ හඳුනානොගත් ශේෂය රු. 146,207 ක් විය. | රු.146,206 ක හඳුනානොගත් ශේෂය සඳහා තොරතුරු නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජුනි 21 දිනැති අංක 05/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ "ආ" ඡේදය | මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 223,530 ක ණය ශේෂ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.584,183 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 44,442,002 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,179,120 | 4,280,694 | 4,954,562 | 1,276,160 | 785,670 | 754,164 | 610,230 | 1,950,028 |
| කුලී | 16,185,136 | 18,624,506 | 18,758,015 | 12,498 | 19,797,540 | 16,947,780 | 14,063,194 | 146,007 |
| බලපත්‍ර ගාස්තු | 10,957,042 | 2,028,652 | 2,633,482 | 242,200 | 9,907,862 | 1,728,121 | 1,594,971 | 847,030 |
| වෙනත් ආදායම් | 5,353,800 | 5,087,457 | 4,329,770 | 798,287 | 66,765,140 | 5,137,205 | 5,032,205 | 40,600 |
| **එකතුව** | **36,675,098** | **30,021,309** | **30,675,829** | **2,329,145** | **97,256,212** | **24,567,270** | **21,300,600** | **2,983,665** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු වරිපනම් බදු රු. 868,076 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ හඳුනාගත හැකි දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනානොගෙන 2010/2011 වර්ෂයේදී හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තක්සේරුවක් සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කළ බව . | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1946 අංක 30 දරණ බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වෙනි වගන්තිය පරිදි වරිපනම් දේපළ වර්ෂ 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවත්, 2011 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි. | නව වරිපනම් තක්සේරුවක් සිදුකිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කළ බව . | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර ඒකක 39 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත ඒකක 17 කින් ලැබිය යුතු කර්මාන්ත බදු පිළිවෙලින් රු.64,800 ක් හා රු.14,250 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 21,450 ක් කපා හැරීම සඳහා අනුමැතියට යොමුකළ අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 25 කින් ලැබිය යුතු එකතුව රු.25,000 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු. 3,000 ක් කපා හැරීම සඳහා අනුමැතියට යොමුකළ අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 13 කින් රු.217,200 ක ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,800,143 ක් සහ රු.2,730,670 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු බැල්ලගස්වැව පිහිටි කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ 2018 ජනවාරි 26 දිනැති තක්සේරු වාර්තාව අනුව මාසික කඩ කුලිය අය කළ යුතු වුවත්, 2018 මැයි 18 දිනැති සභා තීරණයට අනුව එම කඩ කාමර සඳහා අඩු කුලියක් අයකර තිබීමෙන් 2018 වර්ෂයේ ජුලි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සභාවට අහිමි වූ ආදායම රු. 776,800 ක් විය. | සභාව තීරණය කල කඩ කුලියක් අයකළ බවත්, 2022 දෙසැම්බර් 28 දින මෙම කඩ කාමර 12 හම්බන්තොට මහා නගර සභාවට පවරා දීමට කටයුතු කළ බව. | සභා අරමුදලට වූ පාඩුව කඩිනමින් අයකළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 10 දිනැති අංක පීඊ/01/01 දරණ ලිපියේ 06 ඡේදය ප්‍රකාරව නව වීථි ලාම්පු ස්ථාපිත කිරීමේදී විදුලිබල මණ්ඩලයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, වීථි පහන් 2192 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව සහ උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් වියදම් කළ රු. 1,108,125 ක් ප්‍රතිපූර්ණය කරගත නොහැකි වියදමක් වී තිබුණි. | විදුලිබල මණ්ඩලය වෙතින් ඉල්ලීම් කළද අනුමැතිය නොලැබීම නිසා නඩත්තු මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වු බව. | වීථි පහන් නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව භුක්ති විදින ඉඩම් හා ගොඩනැගිලි 53 ක හා ජල බවුසරයේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් , ප්‍රජාශාලා, ක්‍රීඩාපිටි සහ සුසාන භූමි මැනුම් කටයුතු සිදුකළ පසු හා ජල බවුසරය පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු. 8,483,140 ක වියදමක් දරා නිම කළ වියළි කලාපීය උද්භිද උද්‍යානය අසල රථ වාහන නැවතුම්පලෙන් සමාලෝචිත වර්ෂය තුල ඉපයූ ආදායම රු. 26,100 ක් පමණක් වීමෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | උද්භිත උද්‍යානය ඇතුලත රථ වාහන නැවැත්වීම සඳහා රථ වාහන අංගනයක් ඇති බවත්, මෙම රථගාල සඳහා යටිතල පහසුකම් සපයා නොමැති බැවින් වාහන නොපැමිණෙන බව. | අවශ්‍ය යටිතල පහසුකම් සපයා අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2021 සැප්තැම්බර් 09 දින රු. 7,902,800 කට ගිවිසුම්ගත වී ආරම්භ කළ මයුරපුර සතිපොල වාහන නැවතුම්පල ඉදිකිරීමේ කර්මාන්තය 2021 දෙසැම්බර් 07 දිනට නිමකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ගිවිසුම පරිදි අයකළ යුතු රු. 540,484 ක ප්‍රමාද ගාස්තු අයකර නොගෙන ඉටුකළ වැඩ වෙනුවෙන් රු. 2,785,999 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු කර්මාන්තය අත්හැර ගොස් තිබියදී තාක්ෂණ සේවා නිලධාරී විසින් රු.2,785,999 ක කොටස් ගෙවීම් බිල්පතක් පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. | ප්‍රමාද ගාස්තු අයකිරීම සඳහා තීරණය කර, 2023 ජනවාරි 03 දින දෙපාර්ශයේ එකගතාවයෙන් ගිවිසුම අවලංගු කළ අතර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරනු ඇතැයි යන අපේක්ෂාවෙන් ඉටුකර ඇති වැඩ ප්‍රමාණයට පමණක් කොටස් බිල්පත සකස් කර ඉදිරිපත් කළ බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ප්‍රමාද ගාස්තු අයකළ යුතු අතර නිම නොකල කර්මාන්ත සඳහා ගෙවීම් නොකළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය තුළ වූ තනතුරු 07 කට අදාළ අතිරික්තතා 23 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුළ ද්විතීයක මට්ටමේ තනතුරු අතිරික්තයක් නව සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම මත ඇතිවූ බව. | කාර්යය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |